**පන්විල ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 18 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විගණන නිරීක්ෂණය

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කර්මාන්ත ණයහිමියෝ රු.146,107 ක් ගිණුම්වලින් මගහැරී තිබුණි. | ගෙවීම් කර නොමැති බැවින් ණයහිමි කළ යුතු වේ. | ණයහිමි කිරීමට අවශ්‍ය නොවන අතර, සත්‍ය වටිනාකම රු.146,107 කි. |
| (ii) | ප්‍රාග්ධන වියදම හා ආදායම රු.34,999,649 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (iii) | පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වත්කම් 3ක වටිනාකම රු.329,806 ක් මිලදී ගැනීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 1 සිට 5 දක්වා කාලයක් ඉක්මවූ ණයගැති ශේෂ එකතුව රු.2,032,121 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු.1,961,567 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කර්මාන්ත 3 ක මුදල් ප්‍රතිපූර්ණය වී ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | වසර 1 සිට 5 දක්වා කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ශේෂ එකතුව රු.7,199,289 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවූ ශේෂවල එකතුව රු.2,619,143 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට කර්මාන්ත ණයහිමි 12 ක මුදල් ප්‍රතිපූර්ණය වී ඇති බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.2,818,660 ක් වූ ඉඩම්වලට අදාළව හිමිකම් ඔප්පු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | සියළු වත්කම් නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii)ඊ හා (xxx) උප වගන්ති | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරුවලින් රු.463,192 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | පනත අනුව කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,838,528 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,675,644 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,491,000 | 1,377,088 | 1,004,501 | 714,184 | 1,488,000 | 1,493,076 | 1,377,915 | 446,318 |
| (ii) | කුලී | 2,796,045 | 1,957,425 | 741,770 | 1,243,275 | 1,228,800 | 1,124,650 | 1,103,907 | 66,915 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,093,000 | 3,151,119 | 3,017,719 | 156,400 | 2,845,250 | 3,077,965 | 3,026,965 | 72,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,879,000 | 5,026,725 | 913,690 | 5,500,534 | 2,416,600 | 3,209,775 | 1,007,405 | 2,612,269 |
| | | 10,259,045 | 11,512,357 | 5,677,680 | 7,614,393 | 7,978,650 | 8,905,466 | 6,516,192 | 3,197,502 |

### 2.2.2 කුලී

**කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පන්විල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවලින් 2019 වර්ෂයට රු.1,193,400 ක කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීම. | නඩු පැවරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.788,574 ක් හා මුද්දර ගාස්තු රු.3,175,840 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | තව දුරටත් අයවීමට පවතින බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රදේශයට අදාළ ව්‍යවස්ථා සකස් කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේදී රු.1,500,000 ක් වැයකර ඉදිකළ සතිපොළ ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | වත්කම්වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු ව්‍යාපෘතියක් පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කර නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අරමුණු කීපයක් හඳුනාගත් අතර වැඩ සටහන් ක්‍රියාත්මක කරන බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු කඩ කාමර 30 ක 2009 හා 2016 වර්ෂවල තක්සේරු ක්‍රියාත්මක නොකිරීමෙන් රු.3,110,500 ක ආදායමක් අහිමිවී තිබුණි. | තක්සේරු කර වටිනාකම අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නඩු පැවරීම සඳහා කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාව සතු බිම් කට්ටි 08 ක් තක්සේරු කර තිබුණ ද, තක්සේරු බදු කුලිය අනුව ගිවිසුම්ගත වී නොතිබුණි. | තක්සෙරු කුලිය අනුව නව ගිවිසුම්වලට එළඹීම කළ යුතු වේ. | සන්තකය පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව විසින් ක්‍රියාත්මක කරන යෝජනා ක්‍රම 07 ක ජලමනු සවි කිරීමෙන් තොරව රු.200 ක ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි. | ජලමනු සවිකර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජලමනු සවි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක අතිරික්තතා 3 ක් හා සේවක පුරප්පාඩු 8 ක් විය. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | උපාධිධාරී අභ්‍යාසලාභීන් හේතුවෙන් අතිරික්තතා ඇති විය. පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ස්ථාන මාරුවී ගිය සේවකයින් 4 දෙනෙකුගෙන් සහ සේවය අවසන් කරන ලද සේවකයෙකුගෙන් පිළිවෙළින් රු.716,133 ක හා රු.12,600 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කර ඇති බව හා සමහර ශේෂ පියවා ඇති බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.24,880,000 ක් වටිනා වාහන 02 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම වාහන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුහුණු රියදුරන් නොමැති බැවින් භාවිතයට නොගන්නා ලද අතර, රියදුරන් බඳවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන 2 ක් වර්ෂ 2 ½ සිට 12 දක්වා කාලයක් නිෂ්ක්‍රීයව කාර්යාල භූමියේ ගාල්කර තිබුණි. | නිෂ්ක්‍රීය වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | වෙන්දේසි කළහැකි වාහන වෙන්දේසි කිරීමටද යතුරුපැදිය සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |